සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2002 අප්‍රේල්
## கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2002 ஏப்பிரல்
## General Certificate of Education (Adv. Level) Examination, April 2002

**ආර්ථික විද්‍යාව I**
**பொருளியல் I**
**Economics I**

පැ දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

www.pastpaperlk.com
www.artsapi.lk

### II කොටස

**"අ"** උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද,
**"ආ"** උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

---

### "අ" උප කොටස
(මේ කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) වෙළෙඳපොළ ආර්ථිකයක "අදෘශ්‍යමාන හස්තයක්" ක්‍රියාත්මක වේ යැයි බොහෝ විට කියැවේ. මේ ප්‍රකාශයෙන් ඔබට කුමක් අදහස් වේ ද?
   (ii) වෙළෙඳපොළ ආර්ථිකයක පාරිභෝගික ස්වාධිපත්‍යයක් ඇතැයි බොහෝ විට කියැවේ. මේ තර්කය විමසන්න.
   (iii) **"පරිවර්තන ආර්ථික"** වශයෙන් හැඳින්විය හැකි රටවල් **පහක්** නම් කරන්න.

(එක් කොටසකට ලකුණු 05 යි)

2. (i) නිෂ්පාදනයේ බාහිරතා යනුවෙන් කුමක් අදහස් වේ ද?
   (ii) බාහිරතා පවතින විට නිමැවුම ප්‍රශස්ත මට්ටමේ නො පවතී යැයි අප පවසන්නේ මන්ද?
   (iii) තරඟකාරී වෙළෙඳපොළක අලෙවි වන භාණ්ඩයක් නිපදවීමේ දී බාහිර පිරිවැයක් පැවතීම නිසා ඇති වන ආර්ථික ප්‍රතිවිපාක රූප සටහනක් මගින් පැහැදිලි කරන්න.

(එක් කොටසකට ලකුණු 05 යි)

3. නිෂ්පාදන හැකියා මායිම් රූපසටහන් යොදගනිමින් පහත දක්වෙන සිද්ධීන්හි ආර්ථික ප්‍රතිවිපාක සැකෙවින් දක්වන්න.
   (i) නියඟයක් නිසා කෘෂි නිමැවුම පහත වැටීම
   (ii) බල ශක්ති අර්බුදයක් නිසා විදුලිබල සැපයුම දිනපතා සීමා කිරීම
   (iii) යුද්ධයක් නිසා යටිතල පහසුකම් විනාශ වීම
   (iv) රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය නිසා නිමැවුම වැඩි වීම
   (v) කර්මාන්ත දෙකෙහි ම සේවකයන් සඳහා නිපුණතා වර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම

(එක් කොටසකට ලකුණු 03 යි)

4. (i) භාණ්ඩයක සැපයුම් නම්‍යතාව නිර්ණය කෙරෙන සාධක කවරේ ද?
   (ii) ආදායම වැඩි වන විට භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම එක්තරා අවස්ථාවක් දක්වා වැඩි වී, ඉන් පසු නොවෙනස්ව පවතී. මේ තත්ත්වය රූප සටහනක් මගින් ඉදිරිපත් කරන්න.
   (iii) හරස් ඉල්ලුම් නම්‍යතාවෙහි ප්‍රායෝගික වැදගත්කම සැකෙවින් පැහැදිලි කරන්න.

(එක් කොටසකට ලකුණු 05 යි)

[ දෙවෙනි පිටුව බලන්න.

## "ආ" උප කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

5. (i) ආර්ථිකයක ක්‍රියාත්මක වන ප්‍රධාන ආර්ථික කාරකයන් කවරේ ද? (ලකුණු 05 යි)
   (ii) මේ ආර්ථික කාරකයන් අතර පවත්නා අන්තර් සම්බන්ධතා රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

6. (i) $C = a + bY$ යන ආකාරයේ පරිභෝජන ශ්‍රිතයක් රූප සටහනක ඇඳ ආන්තික පරිභෝජන නැඹියාව (MPC) එම රූප සටහනෙහි දක්වන්න.
   (ii) මෙම සරල ආර්ථිකයේ ආයෝජනය ස්ථාවර මට්ටමක පවතී යයි උපකල්පනය කරන්න. සමාහාර වියදම් ශ්‍රිතය ඇඳ සමතුලිත ආදායම් මට්ටම දක්වන්න.
   (iii) ඉහත (i) හි දක්වූ පරිභෝජන ශ්‍රිතයට අනුරූප ඉතුරුම් ශ්‍රිතයක් අඳින්න. ගිලිහීම් සහ එකතුවීම් සමානවීමේ ක්‍රමය යොදගනිමින් සමතුලිත ආදායම් මට්ටම දක්වන්න. (එක් කොටසකට ලකුණු 05 යි)

7. (i) රජයක ආර්ථික අරමුණක් වශයෙන් සාධාරණත්වය යන්නෙන් කුමක් අදහස් වේ ද?
   (ii) බදුකරණයේ දී සාධාරණත්වය සැලකිල්ලට ගන්නේ කෙසේ ද?
   (iii) සාධාරණත්වය රාජ්‍ය වියදම් තුළට ඇතුළත් කරන්නේ කෙසේ ද? (එක් කොටසකට ලකුණු 05 යි)

8. (i) ඉහළ මට්ටමේ අයවැය හිඟ පැවැතීමේ වැදගත් ප්‍රතිඵලයක් වූයේ රාජ්‍ය ණය විශාල වශයෙන් වැඩි වීමයි. 1998 - 2000 කාලය පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)
   (ii) රාජ්‍ය ණය වර්ධනය වීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 05 යි)

* * *

www.pastpaperlk.com www.artsapi.lk

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

104028

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2002 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர) ப் பரீட்சை, 2002 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2002

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

විභාග අංකය : ..............................

## I කොටස

**සැලකිය යුතුයි :**

- මෙම කොටසෙහි ප්‍රශ්න **20** ක් ඇත. ඒ සියලු ප්‍රශ්න **අනිවාර්ය** වේ.
- එක් ප්‍රශ්නයකට **ලකුණු 02** ක් ලැබෙන අතර, මුළු කොටසට **ලකුණු 40** ක් හිමි වේ.
- **බහුවරණ ප්‍රශ්නවල** නිවැරදි පිළිතුර / පිළිතුරු **යටින් ඉරක්** අඳින්න.
- සමහර බහුවරණ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු එකකට වඩා තිබෙන බැවි සලකන්න.
- ඔබ විසින් එවැනි ප්‍රශ්නවලට සියලු ම නිවැරදි පිළිතුරු හඳුනාගත යුතු වේ.
- අනෙකුත් ප්‍රශ්නවලට පිළිතුරු, දී ඇති **හිස් තැන්වල** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු **මෙම පත්‍රයේ ම සැපයිය යුතුයි.**
- නියමිත කාලය අවසන් වූ පසු I හා II **කොටස්** එක පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා ශාලාධිපතිට භාර දිය යුතුයි.

---

1. මුදල් වෙනත් වත්කම්වලින් වෙනස්වන්නේ කුමන සාධකය මගින් ද?
   (i) ගෙනයෑමේ පහසුව
   (ii) ද්‍රවශීලතාව
   (iii) ගබඩාකර තැබීමේ පහසුව
   (iv) රජයේ සහතිකය

2. ණයපත් (Credit Cards) ඔබ ඇතුළත් කරන්නේ පහත දැක්වෙන කුමන කාණ්ඩයට ද?
   (i) පටු මුදල්
   (ii) ආසන්න මුදල්
   (iii) පුළුල් මුදල්
   (iv) මුදල් ආදේශක

3. මුදලෙහි සංසරණ ප්‍රවේගය යන්නෙහි අර්ථය දැක්වෙන ප්‍රකාශ හඳුනාගන්න.
   (i) මුදල් ඒකකයක් කිසියම් කාලයක් තුළ දී කොතරම් වාර ගණනක් ගනුදෙනු සඳහා භාවිත වේ ද යන්න
   (ii) මුදල් ඒකකයකින් කිසියම් කාලයක් තුළ දී කොතරම් වියදම් ප්‍රමාණයක් බිහි වේ ද යන්න
   (iii) ආර්ථිකයක පුළුල් මුදල් සහ පටු මුදල් අතර අනුපාතය
   (iv) කිසියම් මුදල් ප්‍රමාණයක් පදනම් කර ගෙන මැවිය හැකි ණය ප්‍රමාණය
   (v) මුදල් සැපයුමෙන් කොතරම් කොටසක් මහජනයා අත පවතී ද යන්න

[ දෙවෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com www.artsapi.lk

4. ද්‍රවශීල වත්කම් තබාගැනීම එතරම් ලාභදායි නොවේ. එසේ නම් වාණිජ බැංකු සිය වත්කම්වලින් කොටසක් ද්‍රවශීල වත්කම් ලෙස තබාගන්නේ මන්ද?
   (i) ගනුදෙනුකරුවන් ඉල්ලූවිට මුදල් සැපයීම සඳහා
   (ii) සමපේක්ෂණ කාර්යයන් සඳහා
   (iii) තමන්ගේ තැන්පතුවල සුරක්ෂිතභාවය පිළිබඳ ගනුදෙනුකරුවන් තුළ විශ්වාසයක් ගොඩනැගීම සඳහා
   (iv) බැංකු ලාභ උපරිම කිරීමට උත්සාහ නො දරන නිසා
   (v) කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම සඳහා

5. මහ බැංකුව "බැංකුවල බැංකුව" වීමට හේතුවන කටයුතු හඳුනාගන්න.
   (i) වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පතු පවත්වාගෙන යයි.
   (ii) මහ බැංකුව වාණිජ බැංකු සඳහා නිෂ්කාශන ආයතනයක් වශයෙන් කටයුතු කරයි.
   (iii) වාණිජ බැංකු විසින් මුදල් අවශ්‍ය අවස්ථාවලදී මහ බැංකුවෙන් ණය ලබා ගනී.
   (iv) මහ බැංකුව වාණිජ බැංකුවලට උපදේශකයකු ලෙස කටයුතු කරයි.
   (v) වාණිජ බැංකුවලට මහ බැංකුවේ කොටස් හිමි වේ.

6. **මුදල් වැටුප්** වැඩි වුවද **මූර්ත වැටුප්** පහත වැටිය හැක්කේ කිනම් අවස්ථාවක දී ද?
   (i) මුදල් වැටුප් වැඩිවන වේගයට වඩා වැඩි උද්ධමන වේගයක් පවතින විට
   (ii) ජීවන වියදම ඉහළ යන විට
   (iii) අතිකාල වැඩ ප්‍රමාණය අඩු කළ විට
   (iv) පාරිභෝගික භාණ්ඩ සඳහා රජයෙන් සැපයෙන සහනාධාර අඩුකළ විට

7. 2002 ජනවාරි 01 දින **යූරෝ** මුදල් භාවිතය ආරම්භ විය. යූරෝ යනු කුමක් ද?
   (i) යුරෝපයේ සියලුම රටවල් භාවිත කරන පොදු මුදලක්
   (ii) යුරෝපීය සංගමයේ සාමජික රටවල් 12 ක් විසින් සිය ජාතික මුදල් වෙනුවට යොදා ගෙන ඇති කලාපීය මුදලක්
   (iii) යුරෝපීය රටවල් විසින් එය සංචිත මුදලක් වශයෙන් ඇමරිකානු ඩොලරය වෙනුවට යොදා ගෙන ඇත.
   (iv) අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් බිහි කර ඇති අන්තර්ජාතික මුදලක්

8. අන්තර්ජාතික වෙළෙඳමෙහි සාපේක්ෂ වාසිය යන්නෙන් කුමක් අදහස් වේ ද?
   (i) එක් රටක භාණ්ඩයක් නිපදවීමේ මූල්‍ය පිරිවැය අනෙක් රටට සාපේක්ෂව අඩුවීම.
   (ii) එක් රටක භාණ්ඩයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය අනෙක් රටට සාපේක්ෂව අඩුවීම.
   (iii) භාණ්ඩයක් නිපදවීම සඳහා අවශ්‍ය සම්පත් කිසියම් රටක බහුල වශයෙන් පැවතීම.
   (iv) භාණ්ඩයක් නිපදවීම සඳහා අවශ්‍ය ශ්‍රමය අඩු පිරිවැයකින් ලබා ගැනීමට හැකි වීම.

9. අබාධ වෙළෙඳාම මත සීමා පැනවීම සඳහා ඉදිරිපත් කර ඇති වඩාත් ම වැදගත් තර්කය කුමක් ද?
   (i) සමහර භාණ්ඩවලින් ස්වයංපෝෂිතවීමේ අවශ්‍යතාව
   (ii) අලුත් කර්මාන්තවල පිරිවැය ආරම්භයේ දී ඉහළ බැවින් ඒවාට ආනයන සමග තරඟ කිරීමට නො හැකි නිසා ඒවාට ආරක්ෂණයක් අවශ්‍ය වේ.
   (iii) පාරිභෝගිකයෝ ආනයන භාණ්ඩවලට ඇල්මක් දක්වති.
   (iv) අබාධ ලෙස ආනයනය කිරීම මගින් ගෙවුම් ශේෂ ප්‍රශ්න ඇතිවේ.

10. ගෙවුම් ශේෂ ලේඛනයක වර්තන ගිණුමට අයත් ආදායම් ගිණුමට ඇතුළත් කෙරෙන වඩාත් ම වැදගත් දෑ මොනවා ද?
   (i) අපනයන ආදායම
   (ii) ලාභ සහ ලාභාංශ
   (iii) විදේශ ණය සඳහා පොලී
   (iv) සංචාරක ව්‍යාපාරයේ ආදායම
   (v) සංක්‍රමිකයන් විසින් යැපෙන්නන්ට එවන මුදල් (ප්‍රේෂණ)



www.pastpaperlk.com
www.artsapi.lk

11. යම් කාලච්ඡේදයක් තුළ කිසියම් භූගෝලීය ප්‍රදේශයක සියලු නිෂ්පාදන කටයුතුවල එකතු කළ අගයේ එකතුව හැඳින්වෙන්නේ

(i) දළ ජාතික නිෂ්පාදිතය
(ii) දළ දේශීය නිෂ්පාදිතය
(iii) මූර්ත ජාතික නිෂ්පාදිතය
(iv) මූළ කාර්මික නිමැවුම

12. ඔබට දළ ජාතික නිෂ්පාදිතයේ අගය සපයා ඇති අතර ඔබ විසින් දළ දේශීය නිෂ්පාදිතයේ අගය ගණනය කළ යුතු ය. මේ සඳහා කළයුතු ගැළපීම් මොනවා ද?

(i) භාණ්ඩ සහ සේවා අපනයන අගය **එකතු කිරීම**
(ii) පිටරටින් ලැබුණු සාධක ආදායම් **අඩු කිරීම**
(iii) භාණ්ඩ සහ සේවා ආනයන අගය **අඩු කිරීම**
(iv) පිටරටින් ලබාගත් සාධක සේවා සඳහා ගෙවීම් **එකතු කිරීම**
(v) ශුද්ධ විදේශ ආයෝජනය **අඩු කිරීම**

13. ඔබට එකඟ විය හැකි ප්‍රකාශ හඳුනාගන්න.

(i) දළ දේශීය වියදම යනු ආර්ථිකයක මුළු පරිභෝජන හා ආයෝජන වියදමේ එකතුවයි.
(ii) දළ දේශීය වියදමින් ආනයන අගය අඩු කළ විට දළ දේශීය නිෂ්පාදිතය ලැබේ.
(iii) දළ ජාතික නිෂ්පාදිතයෙන් ප්‍රාග්ධන භාණ්ඩ ක්ෂයවීම් අඩු කළ විට ශුද්ධ ජාතික නිෂ්පාදිතය ලැබේ.
(iv) නිෂ්පාදනයෙන් බිහිවුන වැටුප්, බදු කුලී, පොලී සහ ලාභ යන ආදායම්වල එකතුව දළ දේශීය නිෂ්පාදිතයට සමාන වේ.

14. සරල ආර්ථිකයක සමතුලිත ආදායම් මට්ටම (Y) රුපියල් බිලියන 1000 ක් යයි ද ආන්තික පරිභෝජන නැඹියාව (MPC) 0·8 ක් යයි ද සිතන්න. සමතුලිත ආදායම රුපියල් බිලියන 1500 ක් වීමට අයෝජනය (I) කොතරම් වැඩි විය යුතු ද?

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

15. සරල ආර්ථිකයක සාමාන්‍ය පරිභෝජන නැඹියාව (APC) 0·75ක් යයි ද ආයෝජන මට්ටම (I) රුපියල් බිලියන 400 ක් යයි ද සිතන්න. සමතුලිත ආදායම් මට්ටම කොපමණ ද?

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

16. විවෘත ආර්ථිකයක ආදායම් ප්‍රවාහයෙන් සිදුවන ගිලිහීම් කවරේ ද? නිවැරදි පිළිතුරු **යටින් ඉරි අඳින්න.**

පරිභෝජනය; ඉතිරිකිරීම්; ආයෝජනය; බදු; සහනාධාර;
ආනයන; අපනයන; විදේශ සංචිත පහත වැටීම; රාජ්‍ය ණය



www.pastpaperlk.com
www.artsapi.lk

17. පිස්කල් ප්‍රතිපත්තිය යනුවෙන් කුමක් අදහස් වේ ද?
   (i) ව්‍යවසායකයන්ට බදු සහන් සැලසීම
   (ii) අයවැය හිඟය අඩු කර ගැනීම සඳහා යොදගන්නා ප්‍රතිපත්ති
   (iii) රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා බදු, රාජ්‍ය වියදම් සහ අයවැය හිඟය / අතිරික්තය යොද ගැනීම
   (iv) විදේශ ගෙවුම් ශේෂයේ හිඟය අඩුකර ගැනීම සඳහා යොදගන්නා ප්‍රතිපත්ති

18. 2000 වසරේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අයවැයෙහි සමස්ත හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් කොපමණ වී ද?
   (i) 5 - 6
   (ii) 7 - 8
   (iii) 9 - 10
   (iv) 11 - 12

19. ශ්‍රී ලංකා රාජ්‍ය ආදායමෙහි වඩාත් ම වැදගත් මාර්ග දෙක හඳුනාගන්න.
   (i) ආදායම් බදු
   (ii) දේශීය භාණ්ඩ සහ සේවා මත බදු
   (iii) අන්තර්ජාතික වෙළෙඳම මත බදු
   (iv) වෙනත් බදු
   (v) බදු නො වන ආදායම

20. 1999-2000 වර්ෂවල දී ශ්‍රී ලංකා රජයේ වර්තන වියදමින් සැලකිය යුතු කොටසක් වැය වූයේ රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීමට යි. එම කොටස කොපමණ ද?
   (i) 19% - 21%
   (ii) 22% - 24.%
   (iii) 25% - 27%
   (iv) 28% - 30%

**

www.pastpaperlk.com
www.artsapi.lk